# නෙත්ති පෙට කොපදෙස හා ත්‍රිපිටක ධර්මය හැදෑරීමේදී ඉන් ලැබෙන පිටුවහල

බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨයේ කථිකාචාර්ය ශාස්ත්‍රාචාර්ය
මුරුතැන්නේ පේමාලංකාර ස්ථවිර

## පෙර පසු බව

නෙත්ති ප්‍රකරණය හා පෙට කොපදෙශයද එකම පරමාර්ථයක් ඉටුකර ගැනිම පෙරදැරි කරගෙන රචිත පොත් දෙකක් බව එහි එන කරුණු පරික්ෂාකර බලන විට පෙනී යයි. පෙට කොපදෙසය අසංවිධානාත්මක අන්දමින් දීර්ඝ විස්තර ඉදිරිපත් කරන අතර නෙත්තිය සංවිධානාත්මකව සංක්ෂිප්ත අන්දමින් කරුණු ඉදිරිපත් කරයි. මේ පොත් දෙක ගැන අවබෝධයක් ලබා ගැනීමට ඒ දෙකෙහි සැලැස්ම පිලිබඳව විමසා බැලීම ප්‍රයෝජනවත් වේ. මේ ග්‍රන්ථද්වයේ කතුවරුන් ගැන හා පෙරපසු භාවය ගැන විවිධ මතභේද පවතී. නෙත්තියට පසුව පෙට කොපදෙසය රචනා කරන ලදැයි සමහරු පවසති. එසේ කියන්නන් අතර මහාචාර්ය ඇම්. බී. බරුවා සහ ආචාර්ය හාඩි ප්‍රධාන වෙති. ඒ වියත්තු පෙට කොපදෙසයේ පශ්චාත්ගාමිත්වය දක්වීමට පිහිට කොට ගෙන ඇත්තේ නෙත්තියේ සංගහවාරයේ එන "සොලසහරා නෙත්ති" යනාදී ගාථාවයි ඒ ගාථාව පොත් දෙකේම සමානව දක්නා ලැබේ. ඒ නිසා මේ ගාථාව නෙත්තියෙන් පෙට කොපදෙසයට උපුටා ගන්නා ලද බවයි. මේ වියතුන් සලකන්නේත් මහාචාර්ය ගුණපාල මලලසේකර ශූරීන් කියන්නේත් නෙත්තියට කලින් පෙටකොපදෙශය රචිත බවයි. එතුමා එසේ කියන්නේ අර්ථකථාචාර්ය බුදු ගොස් හිමි අර්ථකථා කරණයේදී නෙත්තිය පරිශිලනය කළ බවට සාධක දුර්ලභයයි දක්වමිනි. එහෙත් "අටුවා කරණයේදී බුදු ගොස් හිමි නෙත්තිය පරිශිලනය නො කළේය යන අදහසට එකඟ විය නොහැකි වුවත් නෙත්තිය පසුව රචිතය යන්න අපිදු පිළිගනිමු. බුද්ධඝොස හිමි නෙත්තිය පරිශිලනය නොකළේය යන්න පිළිගත නොහැක්කේ උන්වහන්සේ නෙත්ති පෙටකොපදෙස දෙකම පරිශීලනය කළ බවට සාධක උන්වහන්සේගේ අටුවාවල දක්නට ඇති නිසාය. පපංච සූදනියේ මජ්ඣිම නිකායට්ඨ කථාවේ මූලපරියාය වත්ථුසූත්‍ර අටුවාවල නෙත්තියෙන් උපුටාගත් කරුණු පමණක් නොව නෙත්තිය නමින්ම සඳහන් කර තිබේ. එය පසෙක තිබියේවා හාඩි හා බරුවා මහතුන් කියන පරිදි "සොළසහරා නෙත්ති" යනාදි ගාථාවේ "නෙත්ති" යන පදයෙන් කියැවෙන්නේ පොත ගැන නොවේ. නෙත්තියෙන් ඉදිරිපත් කරන අර්ථ සංවර්ණනා ක්‍රමයයි. "සද්ධම්ම නයනට්ඨෙන නෙත්ති" ආදී වශයෙන් නෙත්ති පදය විවරණය කරණ ආකාරයෙන්ම ඒ පෙනේ. හැරත් පොත් දෙකේම ඒ ගාථාව සඳහන් වන බැවින් නෙත්තියෙන් පෙට කොපදෙසයට උපුටාගත්තේද පෙට කොපදෙසයෙන් නෙත්තියට උපුටා ගත්තේද යනුත් ස්ථිර ලෙස කිව නොහැකිය, ග්‍රන්ථ දෙකේ සැලැස්ම ගැන සලකා බලන විට පෙනී යන්නේ නෙත්තිය පසුව රචනා කරන ලද බවයි.

ඥානමෝලි හිමියන් කියන්නේද නෙත්තිය පසුව රචනා කළ බවයි. උන්වහන්සේගේ නෙත්ති සංස්කරණයේ ඒ ගැන දිර්ඝ විස්තරයක් එයි. පෙට කොපදේසයේ ඇති ආකුලභාවයත් නෙත්තියේ ඇති ක්‍රමානුකූලභාවයත් ගැන සලකන විට නෙත්තිය පසුව රචිත යයි සිතිය හැකිය. පෙට කොපදේසයේ පරිච්ඡේද අටකි. නෙත්තියේ පරිච්ඡේද සතරකි. පෙට කොපදෙසයේ පරිච්ඡේද අටේම කරුණු නෙත්තියේ පරිච්ඡේද සතර තුළ ඇතුලත්ව ඇති සැටි පෙනෙයි. පෙට කොපදෙසයේ වැඩි පරිච්ඡේද ගණනත් නෙත්තියේ අඩු පරිච්ඡේද ගණනත් ගැන සලකනවිටද පෙට කොපදේසයේ මෙන් අති විස්තාර නැති කොට පසුව නෙත්තිය රචිත යයි සිතියහැක. සූත්ත විභංගයෙන් ප්‍රාතිමොක්ෂයද දීපවංශය බලා මහාවංසයද සකස් වූවාක් මෙනැයි සිතියහැකිය. එහෙත් ඉහත සඳහන් කරුණු ගැනද වියතුන් විවිධ මත පළ කරනවා මිසක් ස්ථිර නිගමනයක් නැත.

## කාලය

නෙත්තියේ හා පෙට කොපදේසයේ පෙර පසු භාවය ගැන මෙන්ම එහි කාලය ගැනද ස්ථිර නිගමනයක් දීම අපහසුය. මහාචර්යාය මලලසේකර ශූරින් ගේ අදහස නෙත්තිය ක්‍රි: ව: 7 ක් වන සියවසෙන් එහා නොවිය හැකි බවයි. එසේ කියන්නේ ආචාර්ය බුදුගොස් හිමියන් නෙත්තිය පරිශීලනය නො කළහයි සිත තබා ගෙනය. එහෙත් බුදුගොස් හිමි නෙත්තිය පරිශීලනය කළ බවට සාධක උන්වහන්සේගේ අටුවාවල පෙනේ. ඒ නිසා ආචාර්ය බුද්ධඝොස හිමියන්ට පෙරාතුව නෙත්තිය තිබුණු බැව් කිව හැකිය. නෙත්ති අටුවාව ප්‍රථම සංගීතිය තෙක් නෙත්තිය ඉදිරියට ගෙන යයි.

"එත්තාවතා සමන්තා නෙත්තියා
මහාකච්චානෙන භාසිතා
භගවතා අනුමොදිතා මූලසංගීතියා සංගීතාව"

මේ අනුව නෙත්තිය බුද්ධකාලය දක්වාම ඈතට යනු පෙනේ. එසේ කීමට සිදුවන්නේ නෙත්තියේ

කතෘත්වය අගසව් මහාකච්චායන මහරහතන් වහන්සේගේ නමට පවරා තිබෙන බැවින්ය. ඒ ගැන අපි පසුව සලකා බලමු. සාමාන්‍ය පිළිගැනීම අනුව නෙත්තියේ කාලය ක්‍රි. පූ. 80 පමණ වේයයි සලකනු ලැබේ. පෙට කොපදේසයේ කතෘත්වයද මහකච්චායන මහ රහතන් වහන්සේ ගේ නමට පැවරී ඇති බැවින් කාලය අතින් ග්‍රන්ථ දෙකට එතරම් පරතරයක් ඇතැයි සිතිය නොහැකිය.

කතුවරු

නෙත්ති - පෙටකොපදෙස දෙකේම කතෘත්වය පාරම්පරික මතය අනුව මහා ශ්‍රාවක මහා කච්චායන මහ රහතන් වහන්සේට පැවරෙයි. එහෙත් මෙහි කතෘ මහසවු කසයින් තෙරණුවෝමද යනු බොහෝ දෙනාගේ සැකයට භාජනය වී පවතින්නකි. ග්‍රන්ථ දෙකේම කතෘත්වය සඳහන් කරන්නේ මෙසේය.

නෙත්තියේ: -

i. මහාකච්චානෙන නිද්දිට්ඨා

ii. මහාකච්චාන ගොත්තෙන නිද්දිට්ඨා

පෙටකොප දේශයේ:-

i. කච්චාන ගොත්තෙන නිද්දිට්ඨා

ii. ජම්බුවන වාසි කච්චානෙන

නෙත්ති අටුවාව:-

i. එත්තාවතා... මහාකච්චානෙ භාසිතා...

යනාදී වශයෙන් එහි කතෘත්වය සඳහන් කරණු ලැබේ. මහසව් කසයින් මහරහතන් වහන්සේ කෙටියෙන් කියූ දෙය විස්තර කිරීමෙහි ලා සමර්ථ යෙකු වශයෙන් බුදුන් වහන්සේගෙන් පවා පැසසුම් ලත් සේක. එසේම එම විෂයය ගැන ලබා තිබූ දක්ෂතාව නිසා සම්මාන ලැබූ සේක. සූත්‍ර පිටකයේ කීප තැනකම බුදුන් වහන්සේ සංක්ෂිප්තව දෙසූ ධර්මයන් මහා කච්චායන මහ රහතන් වහන්සේ අතින් භික්ෂූන් වහන්සේලාට විස්තර කරදී තිබෙනු දක්නට ලැබේ. උන් වහන්සේ වැඩ සිටියේ ද භික්ෂූන් වහන්සේ අඩු ප්‍රදේශයක් වූ අවන්ති ප්‍රදේශයේය. එය පිටිසර පළාතකි.

එම නිසා බුදුන් වහන්සේ සැකෙවින් දෙසූ දහම් සිය අනුගාමිකයන්ට විස්තර වශයෙන් කියාදීම උන්වහන්සේ වෙත පැවරී තිබුනු යුතුකමකි. එවැනි දුර බැහැර පෙදෙස්වල වාසය කළ භික්ෂූන් වහන්සේලාට ධර්මය පිළිබඳව අනවබෝධ ස්ථාන අවබෝධකර ගැනීමට පහසු ක්‍රමයක් තිබිය යුතුය. මේ අවශ්‍යතාව සපුරාලීමට ධර්මය විස්තර කිරීමේ න්‍යායක් - පහසු මගක් ගැන සිතන්නට ඇතැයි කීම වැරදි නොවේ. මහාකච්චාන මහ රහතන් වහන්සේ ගේ ශිෂ්‍ය පරපුර ධර්මය විස්තර කිරීමේ කාර්‍යයෙහි දක්ෂ භික්ෂූන් වශයෙන් සිටිය වග පෙනේ. එය තහවුරු කිරීමට බාහිර සාධකයක්ද වෙයි. දෙවන සංගීතියේදී දසවස්තුව විනිශ්චය කිරීමට අවන්තියේ භික්ෂූන් වහන්සේලා කැඳවීමද ඊට සාධකයයි. මේ අනුව මහා සව් මහ කච්චායන මහරහතන් වහන්සේ විසින් ස්වකීය සද්ධිවිහාරිකයන්ට පුහුණු කරනු ලැබූ පරපුරෙන් පරපුරට පවත්වා ගෙන එන ලද ධර්මය විස්තර කිරීමේ කිසියම් න්‍යාය ක්‍රමයක් පවතින්නට ඇතැයි අනුමාන කළ හැකිය. ලක්දිව බුදු සසුන් පිහිටුවාලූ මිහිඳු මහ රහතන් වහන්සේද අවන්තියේ වැසියෙකි. නැතිනම් උන්වහන්සේ අවන්ති දේසය හා සබඳකම් ඇත්තෙකි.

මිහිඳු හිමියෝ අවන්තියේදී මහා කච්චාන පාරම්පරික භික්ෂූන් වෙතින් එම න්‍යාය ක්‍රමය හදරා තිබේ බුදු සමයත් සමග ලක්දිවට ගෙන එන්නට ඇතැයි අනුමාන කල හැකිය. එසේ නැතහොත් භාරතීය කිසියම් භික්ෂූන් වහන්සේනමක් විසින් කච්චායන න්‍යාය ක්‍රමය අනුව ග්‍රන්ථය සම්පාදනය කර එහි කර්තෘභූත මහා කච්චායන හිමියන් නමින්ම තබන්නට ඇතැයිද කල්පනා කළ හැකිය. එසේ පවරනු ලැබූ වෙනත් කෘති ගැනද අපට අසන්නට ලැබේ. අභිධර්මය හා පටිසම්භිදාමාර්ගය අග්‍රශ්‍රාවක ශාරිපුත්‍ර මහ රහතන් වහන්සේ නමටත් පරිවාරය බුද්ධභාසිතයක් බවටත් පවරනු පෙනේ.. ග්‍රන්ථයේ ගෞරවය රැකෙනු සඳහා එවැනි මහා ශ්‍රාවකයකුගේ නමින් තබන ලදැයිද සිතිය හැකිය. කච්චායන කරණයද නෙත්ති පෙටකොප දේසයෙන් මෙන් මහා කච්චායන හිමියන් නමට පවරන තවත් කෘතියකි. නෙත්ති පෙටකොපදේසයන් දුන් නොවුවත් එහි න්‍යාය ක්‍රමය උන්වහන්සේගේ විය හැකිය.

මේ ග්‍රන්ථයන්හි කර්තෘ මහා කච්චායන හිමියන් නොවේ යයි සිතීමට කරුණුද නැත්තේ නොවේ. මේ පොත් මහා කච්චායන හිමියන් විසින් කරන ලද නම් ''පරිවාරය උභයපාතිමොක්ඛ'' වැනි පොත්වලට පවා විනය පිටකයේ තැනක් ලබා දෙන ''බුද්දක පාඨය'' වැනි පොත් බුද්දකනිකායට ඇතුළත් කරන ආචාර්ය බුදුගොස් හිමියන්ගේ ත්‍රිපිටක ග්‍රන්ථ නාමාවලියට මේවා ඇතුළත් නොකරන්නම හේතුවක් නැත මෙයද සිතිය යුතු කාරණයකි. එසේම මහා කච්චාන හිමියන් හැඳින්වීම සඳහා ''කච්චායන ගොත්ත ජම්බුවනවාසී මහාකච්චාන'' යනු වෙනත් තැනක සඳහන් වනු නො පෙනේ. මේ අනුව ''කච්චායන'' නම ඇති කිසියම් භික්ෂුවක් විසින් රචනා කරන ලදුව නමේ සමාන කමක්, වර්ණිත විෂය ගැන මහසවු මහ කසයින් හිමි ලබා තිබූ ප්‍රසිද්ධියක් ගැන සලකා එහි කතෘත්වය උන්වහන්සේ වෙතම කාලය විසින් පවරණ ලදැයි සැලකීමට පුළුවනි. එසේම එක විෂයයක් ගැන සමාන මුහුණුවරක් ඇති ග්‍රන්ථ දෙකක් එක් අයකු විසින් රචනා කිරීමද සැළකිය යුතු කාරණයකි. කෙසේ නමුත් මහා කච්චායන මහරහතන් වහන්සේ විසින් දක්වන ලද න්‍යාය ක්‍රමයක් අනුව

පශ්චාත් කාලීන භික්ෂුවක විසින් සම්පාදිතව නෙත්ති පෙට කොපදෙස දෙක මහාකච්චායන මහ රහතන් වහන්සේ වෙත පවරන ලදැයි ගැනීම යට දක්වන ලද සියළු කරුණු සලකා බලනවිට මැනවැයි හැඟේ.

**නෙත්ති - පෙට / කොපදෙස දෙක්හි පරමාර්ථය**

නෙත්තිය හා පෙටකොපදෙසස අටුවා ග්‍රන්ථ නොවේ. ධර්මය හොඳින් දන්නවුනට ධර්මය මැනවින් නන් අයුරින් විභාග කොට බැලීමට මග පෙන්වන කෘතියක් වශයෙන්ද අටුවා කරුවන්ට අටුවා කරණයේදී උපදෙස් දෙන ග්‍රනථ වශයෙන්ද, මේ පොත් දෙක වැදගත් වේ. නෙත්තිය පමණක් ගෙන සලකා බැලීමේදී එය සම්පූර්ණවූ නිර්මාණයක් නොව සැලකිල්ලක් බව පෙනී යයි.

භාෂ්‍යක් වූ කලී අංග දෙකකින් යුක්ත විය යුතු යැයි පිළිගැනී ඇත.

i. පද විග්‍රහය හෙවත් පදය මුල් කරගෙන එහි අර්ථ දක්වීම

ii. පද පිළිවෙළ අනුව අර්ථාවබෝධයට උපකාරීවීම

යන අංග දෙකයි ඒ මෙයින් පදයට වඩා අර්ථයට තැනක්දීම වැදගත් වේ. අදහස් පළ කිරීමට-අවබෝධ කිරීමට පදය උදව් වන්නේ නමුත් අර්ථය ගැන නොසලකා පදයට මුල් තැන දීම ව්‍යාකරණය අනුව සිදුවන්නකි. නෙත්තිය මුල් තැන දී ඇත්තේ අර්ථයට මිස පදයට නොවේ. අර්ථය ගැන පමණක් සලකා ලියන ලද පොත් දුර්ලභ වුවද නෙත්තිය හා පෙටකොපදෙස දෙක ඒ ගණයෙහි ලා ගිණිය හැකිය. මෙහි පරමාර්ථය දේශනා පාඨයක අර්ථය නන් අයුරින් දැන ගැනීමට නා නා විධ ක්‍රම ඉදිරිපත් කිරීමයි. එසේ කිරීමේදී පදයට වඩා අර්ථයට මුල් තැන දෙන නිසා නෙත්තියේදී පද පිළිබඳ ගැටළු මතු නොවේ. නෙත්තියේ අර්ථ ප්‍රකාශ කිරීමට යොදගත් න්‍යායයන් අතර සොළසහාර පඤ්චනය අට්ඨාරස මූලපද යන ක්‍රම තුන අනුගමනය කරනු ලැබේ. අර්ථ ප්‍රකාශනයේදී හෙවත් විස්තර කිරීමේදී කවර භාෂ්‍යක වුවද අපේක්ෂා කරන ප්‍රයෝජන හෙවත් ක්‍රම දෙකක් වෙයි.

i. අර්ථ කථනය විස්තර කිරීම, සාධක එළවීම නිගමන වලට බැසීම පළමු වැන්නයි.

ii. මෙසේ බැසගත් නිගමන හෙවත් අර්ථ විසිරයාමට හෝ අන්‍යමත සමඟ මිශ්‍ර වීමට ඉඩ නොතබා රැක ගැනීම දෙවැන්නයි.

සෑම භාෂ්‍යකරුවකු විසින්ම මේ ප්‍රයෝජන දෙක ඉටුකර ගැනීම සඳහා භාෂ්‍ය සපයනු ලැබේ. අර්ථකථා කරුවාගේ ප්‍රයත්නය ද ඒ සඳහාම විය. අර්ථකථා ලිවීම පරිවර්තනය මෙන් නොව යම් අදහසක් දීමට වෑයම් කිරීමකි පරිවර්තකයා මෙන්ම අටුවාකරුවාද මූලික පාඨයේ අදහස අවබෝධ කර ගෙන සිටිය යුතුය. එසේම නව්‍ය වාක්‍ය ස්වරූපය කින් අර්ථය පැහැදිලි කිරීමේදී මූලික අදහසට විරුද්ධ අර්ථයක් ඉස්මතුවී නොසිටින්නට වග බලා ගත යුතුය. මේ අනුව බලන විටද නෙත්තිය මෙහි යට සඳහන් කළ දෙවන ක්‍රමය අනුගමනය කර තිබෙන බව පෙනේ. සූත්‍රවලින් දී ඇති අදහස නව ක්‍රමයකින් ඉදිරිපත් කිරීම මිස නිගමනයක් දීමට උත්සාහ නොකරයි. පෙටකොපදෙසය එයට දී ඇති නම අනුවම ත්‍රිපිටකය හදරන්නවුන්ට උපදෙස් සපයන ග්‍රන්ථයක් බව පෙනී යයි.

නෙත්තිය හඳුන්වන්නේ ද "තෙපිටකස්සපි බුද්ධ වචනස්ස අත්ථ වණ්ණා" "නවඞගස්සත්ථ වණ්ණා" යන ලෙසිනි. එයින්ද පෙනී යන්නේ ත්‍රිපිටක බුද්ධ වචනය හැදැරීමෙහිලා නෙත්තිය උපදෙස් දෙන බවයි. හුදු අටුවාවක් නම් බුද්ධ වචනයේ එක දෙසයක් වෙන් කර ගත්තක් විය යුතුය. මේ අනුව බලනවිට නෙත්තිපෙටකොපදෙස දෙක සකල වචනය හැදෑරීමේදී උපයෝගී කරගත හැකි ග්‍රන්ථ දෙකක් වශයෙන් හැඳින්විය හැකිය.